# FOREIGN FINANCE
# (Part-V)

***S. Madushanka***
***B.Sc (Mgt) Accounting (Special) (U.G)***
***University of Sri Jayewardenepura***

# විදේශ විනිමය වෙළෙඳපොළ

විදේශ විනිමය හුවමාරු වන ආයතනික ව්‍යූහයන්ගේ සම්බන්ධතාවන් විදේශ විනිමය වෙළෙඳපොළ ලෙස හඳුන්වයි.

නොඑසේ නම් විදේශ විනිමය ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන් එම විදේශ විනිමය අනුපාතිකයන් හා හුවමාරු කර ගන්නා විදේශ විනිමය ප්‍රමාණයන් තීරණය කර ගැනීමට සම්බන්ධ වන ආයතනික ව්‍යූහයන් විදේශ විනිමය වෙළෙඳපොළ ලෙස හැඳින්විය හැකි ය.

ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍ය ගනුදෙනු පහසු කිරීම සඳහා විදේශ විනිමය සපයා දීම පිණිස විදේශ විනිමය වෙළෙඳපොළ සංවිධානය වී ඇත.

එම වෙළෙඳපොළවල් ලෝකයේ විශාල ම වෙළෙඳපොළ ලෙස හැඳින්විය හැකි ය.

කොටස් වෙළෙඳපොළකට වඩා විදේශ විනිමය වෙළෙඳපොළ ලෝකය පුරා පැතිරුණු වෙළෙඳුන්ගේ ජාලයක් ලෙස සංවිධානය වී ඇත.

ClassWork.LK

විදේශ විනිමය වෙළෙඳාමේ යෙදී සිටින වෙළෙඳුන් අදාළ විදේශ මුදලේ ගැනුම් මිල සහ විකුණුම් මිල පිළිබඳ තොරතුරු සෙසු වෙළෙඳුන්ගෙන් විමසා බලා වඩාත් වාසිදායක තත්ත්වය තීරණය කරයි.

විදේශ විනිමය වෙළෙඳපොළවල බොහෝ ගනුදෙනු සිදු වන්නේ දුරකථන මගින් වන අතර පසු ව එය විද්‍යුත් තැපෑල හෝ ෆැක්ස් පිණිවිඩ මගින් සනාථ කරගනු ලබයි.

ClassWork.LK

# විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රියාකාරී පාර්ශ්වයන්

විදේශ විනිමය වෙළෙඳපොළේ ක්‍රියාකාරී පාර්ශ්වයන් රාශියක් සිටී.

- වාණිජ බැංකු
- විදේශ විනිමය තැරැව්කරුවන්
- ව්‍යාපාරික ආයතන
- මහ බැංකුව
- මහජනතාව
- ආණ්ඩුව

ClassWork.LK

# වාණිජ බැංකු

වාණිජ බැංකු විදේශීය වෙළෙඳපොළේ වඩාත් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

මෙහි දී විදේශීය විනිමය ගැනුම් මිල සහ විකුණුම් මිල ප්‍රකාශයට පත් කිරීම වැදගත් වේ.

විකුණුම් මිල සහ ගැනුම් මිල අතර පරතරය ආයතනයේ ලාභාන්තිකය නිරූපණය කරයි.

විදේශ විනිමය වෙළෙඳපොළවල බහුල ව හුවමාරු වන්නේ ලෝකයේ ප්‍රබල මුදල් වර්ග වන ඇමරිකා එක්සත් ජනපද ඩොලරය, ස්ටර්ලින් පවුම්, යූරෝ සහ ජපානයේ යෙන් ආදිය යි.

ප්‍රධාන විදේශ විනිමය වෙළෙඳපොළ මධ්‍යස්ථානවල මිල ගණන් අතර කිසියම් වෙනස්කමක් ඇති වුවහොත් විදේශ විනිමය ජාවාරුම්කරුවන් එම අවස්ථාවෙන් ප්‍රයෝජනයට ගෙන ලාභ උපයයි.

එනම් මිල අඩු විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය මිලට ගෙන මිල වැඩි වෙළෙඳපොළටට විදේශ විනිමය අලෙවි කරයි.

ClassWork.LK

## විදේශ විනිමය අනුපාතිකය

දේශීය ව්‍යාවහාර මුදල් ඒකකයක් විදේශ ව්‍යවහාර මුදල් ඒකක බවටත්, විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් දේශීය ව්‍යවහාර මුදල් ඒකක බවටත් පරිවර්තනය කරන අනුපාතිකය විදේශ විනිමය අනුපාතිකය ලෙස හඳුන්වයි.

## නාමික විනිමය අනුපාතිකය

මුදල් ඒකකයක මිල තවත් මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාතිකය නමින් හඳුන්වයි.

## විදේශ විනිමය අනුපාතිකය ප්‍රකාශ කරන ක්‍රම

විදේශ විනිමය අනුපාතිකය ප්‍රකාශ කරන ක්‍රම දෙකක් ඇත. එනම්,

- ඍජු කියවීම්
- වක්‍ර කියවීම්

ClassWork.LK

## සෘජු කියවීම්

සෘජු කියවීමේ ක්‍රමය හෙවත් මිල නිර්ණය කරන ක්‍රමයට විනිමය අනුපාතිකය ප්‍රකාශයට පත් කරන්නේ විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක මිල දේශීය ව්‍යවහාර මුදල්වලින් දැක්වීම මගිනි.

නිදසුන් ලෙස ඇමරිකා එක්සත් ජනපද ඩොලරයක් මිලදී ගැනීමට ශ්‍රී ලංකා රුපියල් කොපමණ ප්‍රමාණයක් අවශ්‍ය ද යන්න දැක්වීම.

USA $ 1 = ශ්‍රී ලංකා රුපියල් 365

ClassWork.LK

# වක්‍ර කියවීම්

වක්‍ර කියවීමේ ක්‍රමය හෙවත් පරිමාව නිර්ණය කිරීමේ ක්‍රමයට විනිමය අනුපාතිකය මගින් දක්වන්නේ දේශීය මුදල් ඒකකයේ මිල විදේශ ව්‍යවහාර මුදල් ඒකක මඟින් දැක්වීමයි.

වක්‍ර කියවීමේ ක්‍රමයට විදේශ විනිමය අනුපාතකය ඍජු කියවීමේ ක්‍රමයට විනිමය අනුපාතිකයේ පරස්පරය යි.

ශ්‍රී ලංකා රුපියල් (LKR) 1 = එක්සත් ජනපද ඩොලර් $= \frac{1}{365} = 0.00273$

ClassWork.LK

## සෘජු කියවීමේ ක්‍රමයට විදේශ විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය

සෘජු කියවීමේ ක්‍රමයට විදේශ විනිමය අනුපාතිකය තීරණය වන්නේ විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට පවතින ඉල්ලුම හා සැපයුම මත ය.

නිදසුනක් ලෙස ඇමරිකා එක්සත් ජනපද ඩොලරයේ රුපියල් මිල තීරණය වන්නේ විදේශ විනිමය වෙළෙඳපොළ තුළ ඩොලර් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත ය.

ඩොලර් ඉල්ලුම් කරන්නේ විදේශ රටවලින් භාණ්ඩ ආනයනය කිරීමට, විදේශ රටවල සංචාරය කිරීමට, ණය ආපසු ගෙවීමට, ණය සඳහා පොළිය ගෙවීමට හා විදේශ රටවලට සංක්‍රාම ගෙවීමට ආදි ගෙවුම් ශේෂ ලේඛනයේ ගෙවීම් ගනුදෙනු පියවීමටය.

ඩොලරයේ රුපියල් මිල හා ඩොලර් ඉල්ලුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.

පවතින විනිමය අනුපාතිකය යටතේ ආනයන වැඩි වීම, විදේශ සංචාර වැඩි වීම, ණය පොළී ගෙවීම් ඉහළ යාම විදේශවලට කෙරෙන සංක්‍රාම ගෙවීම් ඉහළ යාම ආදි සාධක මත ඩොලර් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.

ClassWork.LK

ආනයන අඩු වීම, විදේශ සංචාර අඩු වීම, විදේශ සංක්‍රාම ගෙවීම් අඩු වීම ආදි හේතු මත ඩොලර් ඉල්ලුම් වක්‍රය වම්පසට විතැන් වේ.

ඩොලර් සඳහා සැපයුමක් ඇති වන්නේ භාණ්ඩ අපනයන සේවා ලැබීම්, ප්‍රාථමික ආදායම් ලැබීම්, ද්විතීයක ආදායම් ලැබීම් ආදි ගෙවුම් තුලන ලේඛනයේ ලැබීම් ගනුදෙනු මගිනි.

ඩොලරයේ රුපියල් මිල හා ඩොලර් සැපයුම අතර පවතින්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.


පවත්නා විනිමය අනුපාතිකය යටතේ අපනයන වැඩි වන විට සංචාරක ලැබීම්, ණය ලැබීම් වැඩි වන විට ඩොලර් සැපයුම වැඩි වේ. සැපයුම වක්‍රය දකුණට විතැන් වේ.

අපනයන අඩු වන විට සේවා ලැබීම් අඩු වන විට ඩොලර් සැපයුම අඩු වේ. ඩොලර් සැපයුම් වක්‍රය වම්පසට විතැන් වේ.

ඩොලර් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම තුලනය වන විට ඩොලරයේ රුපියල් මිල තීරණය වේ.

ClassWork.LK

## විදේශ විනිමය අනුපාතිකය $\frac{Rs}{\$}$




ඩොලරයක් රු. 100 බැගින් දිනකට 100 000 ක් හුවමාරු වේ.

ClassWork.LK

## වක්‍ර කියවීමේ ක්‍රමයට විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය

වක්‍ර කියවීමේ ක්‍රමයට විනිමය අනුපාතිකය තීරණය වන්නේ දේශීය ව්‍යවහාර මුදල් ඒකකයට මෙරට තුළ පවතින ඉල්ලුම හා සැපයුම මත ය.

නිදසුනක් ලෙස ශ්‍රී ලංකා රුපියලකින් මිලට ගත හැකි ඇමරිකා එක්සත් ජනපද ඩොලර් ප්‍රමාණය තීරණය වන්නේ ශ්‍රී ලංකා රුපියල් සඳහා පවතින ඉල්ලුම හා සැපයුම මත ය.

අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළේ රුපියල් ඉල්ලුම් කරනු ලබන්නේ විදේශිකයන් විසිනි.

එසේ රුපියල් ඉල්ලුම් කරන්නේ ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ මිලට ගැනීම, ශ්‍රී ලංකාව තුළ සංචාරය කිරීම, ගත් ණය ආපසු ගෙවීම් ආදී ගෙවුම් තුලන ලැබීම් ගනුදෙනු සඳහා ය.

රුපියලේ ඩොලර් මිල හා ශ්‍රී ලංකා රුපියල් ඉල්ලුම අතර පවතින්නේ ප්‍රතිලෝම සම්බන්ධතාවකි.

ClassWork.LK

පවතින විනිමය අනුපාතිකය යටතේ ශ්‍රී ලංකාවේ පැත්තෙන් අපනයන වැඩි වන විට, සේවා ලැබීම් වැඩි වන විට රුපියල් ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ.

අපනයන අඩු වන විට සේවා ලැබීම් අඩු වන විට හා ප්‍රාථමික ආදායම් ලැබීම් අඩු වන විට රුපියල් ඉල්ලුම අඩු වේ. රුපියල් ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර විදේශ විනිමය වෙළෙඳපොළේ රුපියල් සපයන්නේ ස්වදේශිකයන් විසින් ය.

එසේ රුපියල් සපයන්නේ විදේශ රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය සඳහා ය. රුපියල් සපයා ඩොලර් මිල දී ගෙන විදේශ රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය කරයි.

රුපියල් ඩොලර් මිල හා රුපියල් සැපයුම අතර අනුලෝම සම්බන්ධතාවක් පවතී.


පවතින විනිමය අනුපාතිකය යටතේ ආනයන වැඩි වන විට, සේවා ගෙවීම් වැඩි වන විට රුපියල් සැපයුම් දකුණට විතැන් වේ.

ආනයන හා සේවා ගෙවීම් අඩු වන විට රුපියල් සැපයුම් වක්‍රය වමට විතැන් වේ.

ClassWork.LK

විදේශ විනිමය වෙළෙඳපොළේ රුපියල් සඳහා ඇති ඉල්ලුම හා සැපයුම මත රුපියලක ඩොලර් මිල තීරණය වේ.

විදේශ විනිමය අනුපාතිකය $\frac{\$}{Rs}$




රුපියලක වටිනාකමට ඩොලර් 0.002 (0.002$) බැගින් දිනකට ශ්‍රී ලංකා රුපියල් 100 000 ක් හුවමාරු වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura